ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2446/41 – 2025 ජූලි මස 22 වැනි අඟහරුවාදා – 2025.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/2021/56.

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.10 දිනැති හා අංක 2396/61 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.08.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතර, පඹුරන, අබේගුණරත්න මාවත, අංක 18/B/7 ලිපිනයෙහි පදිංචි ටී.එස්. රූපසිංහ මයා සහ බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82 හි පිහිටි රාජ්‍ය දැව සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/37/2024 හා 2025.04.05 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ඩී.එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්

2025 ජූලි මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය : IR/COM/04/2021/56

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

ටී.එස්. රූපසිංහ මයා,
18/B/7,අබෙගුණරත්න මාවත,
පඹුරන, මාතර.

පළමු පාර්ශ්වය

නඩු අංකය : A/37/2024

සහ

රාජ්‍ය දැව සංස්ථාව,
අංක 82, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දෙවැනි පාර්ශ්වය

අතර පවතින ආරාවුල.

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2024.08.02 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට හේතු වී ඇති කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

‘‘රාජ්‍ය දැව සංස්ථාවේ තලල්ල දැව ගබඩාවේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු ලෙස සේවය කළ ටී. එස්. රූපසිංහ මහතාගෙන් 2006 සහ 2007 වර්ෂවලට අදාළව දැව ඌනතා / අතිරික්තතා සඳහා ඔහුගේ වැටුපෙන් සහ ඇප තැම්පතු මුදලෙන් රු. 306,104.75 ක මුදලක් අයකර ගැනීම මගින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේද යන්නත් සහ එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ. ’’

මෙම ආරාවුලට හේතු කාරණාව වනුයේ 2007.04.21 දිනට 2007 වර්ෂයේදී පවත්වන ලද විභාගයේදී 2006 ඌනතා සඳහා රු.84,821.55 සහ 2007 ඌනතා සඳහා 221,283.20 වනසේ රු.306,104.75 මුදලක් සේවයේ යෙදී සිටියදී සහ සේවයෙන් විශ්‍රාම ගිය පසු අයකර ගැනීම සම්බන්ධවයි.

2024.10.21 දින මෙම නඩුව විභාගයට ගත් අවස්ථාවේ දෙවන පාර්ශ්වය මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් මෙම පැමිණිල්ල, ඉල්ලුම්කරු ඉදිරිපත් කොට ඇත්තේ 2019.12.19 දින බවත් ඒ වන විට ඉල්ලුම්කරු විශ්‍රාම ගොස් සිටි බවත් ඉල්ලුම්කරු සමග සජීවී සේවක සේව්‍ය සබඳතාවයක් නොමැති බවත් පවසමින් නඩුව නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සිටී.

මූලික විරෝධතාවයට පළමු පාර්ශ්වය ප්‍රකාශ කරනු ලබන්නේ 2017.02.19 දින විශ්‍රාම ගිය නමුත් ඇප තැන්පත් මුදල ගෙවන ලද්දේ අවුරුදු 1 1/2 පමණ පසු බවත්, එම අවස්ථාවේදී මෙම මුදල අඩු කර ඇති බවත් ය. එසේම සේවකයකුගේ සේවය අවසන් වූ පමණින්

සේවකයෙකුගේ කාර්මික ආරාවුලක් නිරවුල් කිරීමට බාධාවක් නොමැති බවත්, මේ සම්බන්ධව ඉහළ අධිකරණයක් මගින් ලබාදෙන ලද නඩු තීන්දු ද ඇති බවත් ප්‍රකාශ කරයි.

මූලික විරෝධතා සඳහා ලිඛිත දේශන ගොනු කිරීමට දෙවන පාර්ශ්වය ඉල්ලා සිටි. ඒ අනුව ඉදිරියේදී බේරුම්කරණ අධිකරණයේ තීරණය දැනුම්දීමටත්, නඩුව පවත්වගෙන යාමටත් තීරණය කරන ලදි. දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාව සම්බන්ධව පළමු පාර්ශ්වය විසින් 2024.11.04 දින ද දෙවන පාර්ශ්වය විසින් 2024.11.11 දින ද ලිඛිත සැලකිරීම් කරන ලදි.

දෙපාර්ශ්වයේම වාචික සැලකිරීම් සහ ලිඛිත සැලකිරීම් සැලකිල්ලට ගෙන මූලික විරෝධතාවයේ තීන්දුව පහත පරිදි ප්‍රකාශ කරන ලදී.

ආරාවුලට තුඩු දී ඇති ඌනතා අතිරික්ත විගණනය සිදු කොට ඇත්තේ 2007 වර්ෂයේදී ය. 2007 වර්ෂයේදී සිදු කරන ලද විගණනය අනුව ඉල්ලුම්කරු සේවයේ යෙදී සිටියදි ගණනය කරන ලද මුදලින් කොටසක් අයකර ගෙන ඇති අතර තවත් කොටසක් පැමිණිලිකරු විශ්‍රාමයාමෙන් පසුව අයකර ගෙන ඇත.
ඒ අනුව පැහැදිලි වන්නේ මෙම එකම කරුණ සම්බන්ධව දෙවන පාර්ශ්වය විසින් පැමිණිලිකරු විශ්‍රාම යාමට ප්‍රථමව සහ විශ්‍රාම යාමෙන් පසුවද කටයුතු කර ඇති බවයි.

ඒ අනුව මෙම ආරාවුල පැමිණිලිකරුගේ සේවය අවසන් වීමෙන් පසුව නොවන සේවයේ යෙදී සිටියදීම පැන නැගුණු ආරාවුලක් බවට නිගමනය කළෙමි.

එසේම කාර්මික ආරාවුල පනතේ 48 වගන්තිය සඳහන් වන්නේ

''සේවකයා යන්නෙන් ප්‍රකාශිත ගිවිසුමක් වන හෝ ව්‍යාංජිත ගිවිසුමක්, ලිඛිත හෝ වාචික ගිවිසුමක් වන හෝ සේවා ගිවිසුමක් හෝ ආධුනිකත්ව ගිවිසුමක් වන හෝ පුද්ගලිකව යම් වැඩක් කිරීම නැතහොත් ශ්‍රමය යෙදීම සඳහා වූ ගිවිසුමක් වන හෝ යම් ගිවිසුමකින් බැඳී සිටින නැතහොත් එවැනි ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තෙකු අදහස් වන අතර යම් නිශ්චිත අවස්ථාවකදී සේවයේ යෙදී සිටියද නොසිටියද සාමාන්‍යයෙන් එවැනි යම් ගිවිසුමක් යටතේ සේවයේ යොදවනු ලැබූ යම් තැනැත්තෙකු ඊට ඇතුළත් වේ. තවද සේවය අවසන් කරනු ලැබඇති යම් තැනැත්තෙකු ද ඊට ඇතුළත් වේ.

ඉහත කරුණු කාරණා සහ දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද වාචික හා ලිඛිත ප්‍රකාශනද සැලකිල්ලට ගෙන දෙවන පාර්ශ්වයේ මූලික විරෝධතාව ප්‍රතික්ෂේප කොට නඩුව ඉදිරියට පවත්වාගෙන යාමට තීරණය කරන ලදී.

දෙවනුව මා විසින් සලකා බලනුයේ දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයෙන් රු. 306,104.75 වූ මුදල අයකර ගැනීමට කටයුතු කර ඇත්තේ සාධාරණ හේතු සහිතවද රහිතවද යන්නයි.

2001 වර්ෂයේ සිට 2004 වර්ෂයේ මුල් කාලය දක්වා පැමිණිලිකරු මාතර තලල්ල හි සහකාර ප්‍රාදේශීය කළමණාකාර ලෙස සේවය කළ බැව් දෙපාර්ශ්වයම පිළිගනියි.

නඩු විභාගය අතරතුරදී 2005.01.06 දින දෙවන පාර්ශ්වය විසින් ඔප්පු කිරීමේ බාරයට යටත්ව ලකුණු කළ R4, R5, R6 ලේඛනයන්හි සහතික කළ පිටපත් මෝසම් පත්‍රයක් මගින් ගරු බේරුම්කරණ අධිකාරියට ඉදිරිපත් කිරීමට එකඟ වී ඇතත්, 2025.02.21 අවසන් ලිඛිත දේශන සමග R4 ලේඛනයේ සහතික කළ පිටපතක් පමණක් ඉදිරිපත් කොට ඇත. R5, R6 ලේඛනවල සහතික කළ පිටපත් ඉදිරිපත් කොට නොතිබුණි. දෙපාර්ශ්වය විසින්ම ඔප්පු කිරීමේ බාරයට යටත් කොට තිබූ එහෙත් සහතික කර ඔප්පු කර නොතිබූ ලේඛන ප්‍රදානය ලබා දීමේදී සැලකිල්ලට නොගැනීමට තීරණය කරන ලදී. R4 ලේඛනය හා R1 සමාන ලේඛන වන අතර R1 ලේඛනය සහතික කර ඉදිරිපත් කොට ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ තලල්ල දැව ගබඩාවේ සහකාර ප්‍රාදේශීය කළමණාකරු ලෙස සේවය කළ ටී. එස්. රූපසිංහ මහතාගෙන් 2006 සහ 2007 වර්ෂවලට අදාළව දැව ඌනතා / අතිරික්තතා සඳහා ඔහුගේ වැටුපෙන් සහ ඇප තැන්පතු මුදලෙන් රු. 306,104.75 මුදලක් අයකර ගැනීම සම්බන්ධව නඩුව මෙහෙයවමින් දෙවන පාර්ශ්වය 2025.02.21 ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත.

මෙහිදී දෙවන පාර්ශ්වය මෙම මුදල අයකර ගැනිම සඳහා පාදක වූ කරුණු සහ එය සනාථ කිරීම සඳහා ප්‍රධාන කොටම R1, R2, R4, R5, R6 ලේඛන ඉදිරිපත් කරයි.

R2 හා R3 ලේඛන විගණනයකදී දැව ඌනතා සහ අතිරික්තතා අය කර ගැනීම සඳහා ඉවහල් කර ගන්නා ආයතනික චක්‍ර ලේඛනයන්ය.

R1 ලේඛනය 2007.03.20 දින පළාත් කළමණාකාර දකුණු පළාත විසින් සහකාර අභ්‍යන්තර විගණන වෙත ඉදිරිපත් කර ඇති ලිපියකි. එම ලිපිය අනුව සහකාර ප්‍රාදේශීය කළමණාකාර ටී. එස්. රූපසිංහ මහතා (පළමු පාර්ශ්වය) තලල්ල ගබඩාවේ ස්ථානභාර නිලධාරී වශයෙන් නම් කර ඇත. එම ලේඛනය අනුව මෙම ඌනතා/ අතිරික්තතා සඳහා මුදලක් අයකළ බැව් දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරයි.

පළමු පාර්ශ්වය ඌනතා / අතිරික්තයට වගකිව යුතු අයෙකුද යන්න සම්බන්ධව ප්‍රධාන කොටම මා විසින් සලකා බැලිය යුතු වේ. එනම් දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වකරුට තලල්ල ගබඩාවේ ස්ථානභාර නිලධාරි ලෙස 2006/2007 වර්ෂ වන විට වගකීමක් පවරා තිබුනේ ද? යන්නයි.

පළමු පාර්ශ්වකරු තලල්ල දැව ගබඩාවේ ප්‍රාදේශීය සහකාර කළමණාකරු ලෙස සේවය කළ බැව් දෙපාර්ශ්වයම පිළිගනියි. දෙවන පාර්ශ්වය වෙනුවෙන් 2024.12.16 දින සාක්ෂි ලබා දුන් සහකාර අභ්‍යන්තර විගණක නිලූ හංසිකා (85 පිටුව)

ප්‍ර - විශාල ගබඩාවක් හැටියට තීරණය කරන්නේ තොග ප්‍රමාණය මත?
පි ඔව්
ප්‍ර - විශාල ප්‍රමාණයේ ගබඩාවක තොගවල අවම සීමාව කොපමණද?
පි - එහෙම සීමාවක් ගැන නම් මම දැනුවත් නෑ. ස්ථානභාර නිලධාරී පත්කරන්නේ ප්‍රාදේශීය කළමණාකාරනේ. එතකොට ස්ථානභාර නිලධාරි කෙනෙක් පත්කරන්නේ විශාල පරිමාණයේ ගබඩාවකට කුඩා ගබඩාවකට පත්කරන්නේ නැහැ. ඒ අනුව අපට තීරණය කරන්නත් පුළුවන් තලල්ල කියන්නේ විශාල ගබඩාවක් කියලා.

සාක්ෂිකරුගේ මෙම සාක්ෂිය අනුව පැහැදිලි වන්නේ විශාල පරිමාණයේ ගබඩාවකට ස්ථානභාර නිලධාරි ලෙස තනතුරක් ඇති බවයි. එසේම දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සහකාර අභ්‍යන්තර විගණක වෙතින් පළමු පාර්ශ්වය අසන ලද හරස් ප්‍රශ්න කිරීම්වලට අනුව ස්ථානභාර නිලධාරි ලෙස පත්වීමක් පළමු පාර්ශ්වකරු ලබා දී නොමැති බැව් සාක්ෂිවලින් හෙළිදරව් විය. (84 පිටුව)

ප්‍ර - ඔබට පුළුවන්ද ඉදිරිපත් කරන්න රූපසිංහ මහත්තයා ස්ථානභාර නිලධාරී වශයෙන් පත් කළ බවට වූ ලිපියක් හෝ ලිපියක පිටපත්?
පි - R4 ලිපිය තමයි ඉදිරිපත් කරන්න තිබෙන්නේ.

R4 ලිපිය පත්වීම් ලිපියක් නොවේ. එය සහකාර අභ්‍යන්තර විගණක විසින් කරන ලද විමසීමකට අනුව ප්‍රාදේශීය කළමණාකරු විසින් ලබා දෙන ලද පිළිතුරකි. සහකාර අභ්‍යන්තර විගණක නිලු හංසිකා ගේ සාක්ෂියේ (85 පිටුව)

ප්‍ර - මොන ඩොකියුමන්ට් එකෙන්ද අරගෙන තිබෙන්නේ?
පි - R4 කියලා සළකුණු කරපු එකෙන්. තීරණයක් ගන්න බැරුව ඉන්නකොට එවකට සිටි සහකාර අභ්‍යන්තර විගණක ප්‍රාදේශීය කළමණාකරුගෙන් ලිඛිතව විමසලා තියෙනවා. කව්ද මෙතන ස්ථානභාර නිලධාරි මොකද මේ ලිපිය අනුව මෙයා කියලා තිබ්යදී තවදුරටත් විමසීමක් කරලා තිබෙනවා.

R4 ලිපියේ පිටපතක් හෝ පැමිණිලිකරුට යොමු කොට නැත. සහකාර අභ්‍යන්තර විගණකගේ සාක්ෂිය අනුව පැහැදිලි වන්නේ තීරණයක් ගන්න බැරිව ඉන්න කොට මෙම තීරණය, එනම් පැමිණිලිකරුගෙන් මුදල් අයකර ගැනීම සඳහා තීරණය කර ඇති බවයි. ආරාවුලට අදාළ විගණනය කර ඇත්තේ 2007 වර්ෂයේ දිය. පළමු පාර්ශ්වකරු 2017 පෙබරවාරි සිට විශ්‍රාම ගොස් ඇත. ඉන් වර්ෂ 1 1/2 පමණ පසු එනම් 2018 වර්ෂයේදී, 2007 වර්ෂයට අදාළ හිඟ/ අතිරික්තතා ඇප මුදලින් අඩු කර ගෙන ඇත.

සත්‍ය වශයෙන්ම මෙම මුදල පැමිණිලිකරු සේවයේ යෙදී සිටියදීම අයකර ගැනීමට හැකියාව තිබුනත් එසේ නොකොට පැමිණිලිකරු විශ්‍රාම යාමෙන් අනතුරුව ප්‍රමාද වී 2018 වර්ෂයේදී අයකර ගැනිමට කටයුතු කිරීම වෙනුවෙන් සාධාරණ කරුණු ඉදිරිපත් කිරීමක් දෙවන පාර්ශ්වයෙන් සිදු නොවුනි, දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරනු ලබන්නේ R2 හා R 3 චක්‍ර ලේඛනවලට අනුව කටයුතු කළ බවයි.

R2 හා R3 ලේඛනවලට අනුව එසේ ප්‍රමාද වී අය කළ හැකි වුවත්, මෙම පැමිණිලිකරුගෙන් මුදල අයකර ගැනීම ප්‍රමාද විමට හේතු දැක්වීමක් දෙවන පාර්ශ්වයෙන් සිදු නොවුනි.

තවද දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සත්කාර අභ්‍යන්තර විගණක පළමු පාර්ශ්වයේ,

හරස් ප්‍රශ්න කිරීම් වලදී (85 පිටුව)

ප්‍ර - ප්‍රාදේශීය කළමණාකරු හෝ කුමන හෝ උසස් නිලධාරියෙක් රූපසිංහ මහත්තයාව ස්ථානභාර නිලධාරි කියලා නම් ඔහුට යම්කිසි ලේඛනයක් පාදක වෙන්න ඕනේ, ඔහු පත් කරපු ලේඛනයක් තිබෙන්න ඕනනේ, එහෙම ලේඛනයක් තිබෙනවාද ඉදිරිපත් කරලා?

පි - දැනට පවතින ලිපිගොනු අනුව ලේඛනයක් තිබුණේ නැහැ.
(83 පිටුව 5 ජේදය)

ප්‍ර - එම නිසා මම ඔබට යෝජනා කරනවා, මෙම මුදල රූපසිංහ මහත්මයාගෙන් අයකරන්න කිසිම නෛතික බලයක් ඔබේ නිලධාරින්ට නැහැ කියලා ?

පි - පිළිතුර නැහැ
(පිටුව 81 ද 3.4)

ප්‍ර - ඒ වගේ ම ඔබට යෝජනා කරනවා, මෙම මුදල ගෙවීමට කිසිදු බැඳීමක් රූපසිංහ මහත්මයාට නොමැති බවට

පි - පිළිතුර නැත

මෙම සාක්ෂි අනුව පැහැදිලි වන්නේ, ස්ථානභාර නිලධාරී ලෙස නිත්‍යානුකූල වගකීමක් පැවරී නැති සහකාර ප්‍රාදේශීය කළමණාකරු ලෙස සේවය කරන ලද පළමු පාර්ශ්වකරුගෙන් නිත්‍යානුකූල වගකීමක් නොපැවරෙන R4 ලේඛනය පදනම් කොට ගෙන දැව හිඟ / අතිරික්තතා වෙනුවෙන් මුදල් අය කර ගෙන ඇති බවයි.

මෙම කරුණු තව දුරටත් පළමු පාර්ශ්වකරුගේ සාක්ෂියේදී තහවුරු වේ.
සාක්ෂිකරු ප්‍රකාශ කරනුයේ තලල්ල දැව ගබඩාව 2001 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සේවය කළ බවත් දික්වැල්ල, දෙවුන්දර, බෙලිඅත්ත, තංගල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අදාළව දැව ලබා ගැනීම සම්බන්ධව රාජකාරී කටයුතු කිරීමේදී එම ස්ථානවලට ගොස් රාජකාරි කටයුතු කළ බවත් ක්ෂේත්‍ර හෝ රාජකාරිවල යෙදෙන බැවින් සේවා ස්ථානයේ පූර්ණ කාලීනව සේවයේ නොයෙදෙන බවයි. එසේම ගබඩා නිලධාරි සේවා ස්ථානයේ රැඳී සිටින බවත් ප්‍රකාශ කරයි.

එසේම P1 ලෙස නම් කරන ලද රාජ්‍ය දැව සංස්ථාවේ ස්ථාවර නියෝග සටහනේ 12 වන නියෝගය අනුව කාර්ය භාර නිලධාරියා ලෙස ඒකකයේ පාලනය සඳහා පාලන අධිකාරිය විසින් කුමන හෝ ශ්‍රේණියකින් නිලධාරියෙකු පත් කරනු ලබන බවයි. තවද තමන් 2001 සිට 2007 දක්වා සේවය කළ බවත්, එම කාලය තුළදී 2006 ට පෙර කිසිදු අවස්ථාවක තමන්ගෙන් හිඟ/ඌනතා සඳහා මුදල් අයකර ගෙන නොමැති බවත්, කාර්යභාර නිලධාරියෙකු පත් කර තිබූ කාලයේ එම නිලධාරීන්ගෙන් ඌනතා/ අතිරික්තතා ගැලපීම් කළ බවත්, ප්‍රකාශ කර සාක්ෂි ලබා දී ඇත. එසේම 2007 වර්ෂයේදී කාර්ය භාර නිලධාරියෙකු පත් කර නොතිබූ බවත් එම කාලයේ, දී ප්‍රශ්නගත රාජකාරිය වෙනුවෙන් කටයුතු කළේ ගබඩා නිලධාරි W.M.P. වීරසිංහ මහතා බවත් ප්‍රකාශ කරයි. 2024.11.18 දින සාක්ෂි ලබා දෙමින් පැමිණිලිකරු ප්‍රකාශ කරන්නේ මෙම කාල සීමාවේදී තොග භාර ගැනීම, අලෙවිය, නවත්තුවට අදාළ සියළු කටයුතු ගබඩා නිලධාරි W.M.P. වීරසිංහ මහතාගේ අත්සනකින් යුතුව කළ බවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07 රාජකාරී ගබඩාවෙන් බාහිරව කළ නිසා එම කටයුතුවල යෙදීමට ඔහුට හැකියාවක් නොතිබූ බවයි.

ඉහත සියළු කරුණු කාරණා අනුව පැහැදිලි වන්නේ නීතිමය බැඳීමක් වගකීමක් නොමැතිව පැමිණිලිකරුගේ වැටුපෙන් හා ඇප මුදලින් මුදල් අඩු කර ගෙන ඇති බවයි. නියෝජ්‍ය කම්කරු කොමසාරිස්ගේ P6 ලේඛනය මගින්ද තහවුරු කර ඇත්තේ, ඍජුව හෝ වක්‍රව දැව ඌනතා / අතිරික්තතා සඳහා පැමිණිලිකරුගේ සම්බන්ධතාවයක් නොමැති බවයි.

නඩු විභාගයේදී දෙපාර්ශ්වයට විසින් ඉදිරිපත් කරන ලද සියළු කරුණු සලකා බලා පළමු පාර්ශ්වය වන ටී. එස්. රූපසිංහ මහතාට අසාධාරණයක් සිදුව ඇති බවට නිගමනය කරමි.ඒ අනුව පැමිණිලිකාර පළමු පාර්ශ්වයෙන් අඩු කර අයකර ගන්නා ලද රු.306.104.75 (රු, තුන් ලක්ෂ හයදහස් එකසීය හතරයි ශත හැත්තෑ පහක්) මුදල පළමු පාර්ශ්වයට ලබා ගැනීමට හැකි වන සේ මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වයට මින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

ඩබ්ලිව්. ඩබ්ලිව්. පුංචිහේවා,
බේරුම්කරු.

2025 අප්‍රේල් මස 05 දින දී.

EOG 07-0291

මගේ අංකය : IR/COM/03/2019/251.

කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.07.28 දිනැති හා අංක 2290/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.06.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. හික්කඩුව, කලුපේ, අද්දරවත්ත පාර ලිපිනයෙහි හි පදිංචි පී.ඩී.විජිත ප්‍රිය විජේරත්න මයා, 2. වැලිගම, වල්ලිවල, ජයරල පුර, 110 හි පදිංචි ටයිටස් ප්‍රේමනාත් මයා, 3. දික්වැල්ල, කොට්ට ගොඩ, ගොඩ උඩ, 463/ ඒ හි පදිංචි ඒ . එම්. පත්මකුමාර මයා, 4. අකුරැස්ස, දියලපේ, 157/ සී1 හි පදිංචි ජේ. ඒ. ඉන්දික මයා, 5. අකුරැස්ස, ඌරුමුන්න, අලුත් ගෙදරවත්ත හි පදිංචි එම්. ජී. බී. සේනානායක මයා, 6. කුඹල්ගම, රත්නගෙවත්ත හි පදිංචි එච්.කේ. විජිත කුමාර මයා, 7. මාතර, පුහුල්වැල්ල, 10 කණුව, මධුර සෙවන හි පදිංචි එස්.පී.සමන්ති මිය, 8. මාතර, නාවිමන දකුණ, අංක 18 හි පදිංචි එන්. සී. අබේනායක මයා, 9. යටියන, අක්කර 20, “ ලක්ෂිත “ ලිපිනයෙහි පදිංචි එච්.ඩබ්. චන්ද්‍රිකා මිය සහ බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 82 හි පිහිටි රාජ්‍ය දැව සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/31/2022 හා 2025.02.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ඩී.එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්

2025 ජූලි මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණ ශාඛාව - කොළඹ

A/31/2022
IR/COM/03/2019/251

01. පී.ඩී. විජිතප්‍රිය විජේරත්න මයා,
අද්දරවත්ත පාර, කලුපේ, හික්කඩුව.

02. ටයිටස් ප්‍රේමනාත් මයා, 110, ජයරලපුර,
වල්ලිවල, වැලිගම.

03. ඒ. එම් පත්මකුමාර මයා, 463/ ඒ,ගොඩ උඩ,
කොට්ට ගොඩ, දික්වැල්ල

04. ජේ. ඒ. ඉන්දික මයා, 157/සී1, දියලපේ, අකුරැස්ස.

05. එම්.ජී.බී. සේනානායක මයා,
අලුත් ගෙදර වත්ත, ඌරුමුන්න, අකුරැස්ස.

06. එච්.කේ. විජිත කුමාර මයා,
රත්නගෙවත්ත, කුඹල්ගම.

07. එස්. පී. සමන්ති මිය, මධුර සෙවන, 10 කණුව,
පුහුල් වැල්ල, මාතර.

08. එන්.සී.අබේනායක මයා, 18 නාවිමන දකුණ,මාතර.

09. එච්. ඩබ්. චන්ද්‍රිකා මිය, ලක්ෂිත, අක්කර 20, යටියන.

පළමු පාර්ශ්වය

රාජ්‍ය දැව සංස්ථාව,
82, රජමල්වත්ත,
බත්තරමුල්ල.

දෙවන පාර්ශ්වය

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1692 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා සමාංක 2022.10.20 දින දරන නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත් කර, මා වෙත යොමු කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වන්නේ,

2016/2017 වර්ෂවල රාජ්‍ය දැව සංස්ථාවේ බූස්ස ඒකකයේ කළුවර දැව කඳන් හා කඳන් (කළුවර හැර) සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂණය අනුව එම ඌනතාවය ආරක්ෂක නිලධාරීන්ගෙන් අය කර ගැනීම තුළින් රාජ්‍ය දැව සංස්ථාවේ ආරක්ෂක අංශයේ සේවය කළ පහත සඳහන් සේවකයින් නව දෙනාට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබෙනම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.

1. පී. ඩී. විජිතප්‍රිය විජේරත්න මයා
2. ටයිටස් ප්‍රේමනාත් මයා
3. ඒ. එම්. පත්මකුමාර මයා
4. ජේ. ඒ. ඉන්දික මයා
5. එම්.ජී.බී. සේනානායක මයා
6. එච්. කේ. විජිත කුමාර මයා
7. එස්. පී. සමන්ති මිය
8. එන්. සී. අබේනායක මයා
9. එච්. ඩබ්. චන්ද්‍රිකා මිය

මෙම බේරුම්කරණයේ පළමු පාර්ශ්වය වෙනුවෙන් විජිතප්‍රිය විජේරත්න හා ටයිටස් ප්‍රේමනාත් යන අයවලුන්ගේ සාක්ෂි කැඳවීමක් සිදු කළ අතර ඔවුන්ගෙන් දෙවන පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න විමසීමෙන් පසු තවත් පළමු පාර්ශ්වයේ සාමාජිකයින් 04 දෙනෙකුගේද දිවුරුම් ප්‍රකාශද මෙම බේරුම්කරණයට ඉදිරිපත් කරමින් හා 01 වන පාර්ශ්වය විසින් 2023.05.02 වන දින සිය සාක්ෂිකරුවන් මගින් A-1 සිට A-10 දක්වා ලේඛනද ලකුණු කරමින් පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කර ඇත. ඉන්පසු දෙවන පාර්ශ්වය විසින් සාක්ෂිකරුවන් 04 දෙනෙකු කැඳවා ඇති අතර ඔවුන්ගේ සාක්ෂි විභාගය R-1 සිට R-27 දක්වා ලේඛන ඉදිරිපත් කරමින් 2024.05.20 දින අවසන් කර ඇත. දෙපාර්ශ්වය විසින්ම මෙම බේරුම්කරණයට සිය ලිඛිත දේශනද ඉදිරිපත් කර ඇත.

මෙම බේරුම්කරණයට ඉදිරිපත් වී ඇත්තේ ආරාවුල යොමුකර ඇති දෙවන පාර්ශ්වයේ රාජ්‍ය දැව සංස්ථාවේ සේවය කළ සේවකයින් 09 දෙනාගෙන් R-11. R-12 R-13, R-14, R-17 දරන ලේඛන අනුව වැටුපෙන් රු. 99,363.21 මුදලක් අයකිරීම යුක්තිසහගත වන්නේ ද යන්න තීරණය කිරීමටයි. ඒ අනුව මෙම පරීක්ෂණයේ ඉදිරිපත්ව ඇති සාක්ෂි මා විසින් පහත පරිදි ඇගයීමට ලක් කරමි.

පළමු පාර්ශ්වයේ සාක්ෂිකරුවන් දෙදෙනා සාක්ෂි ලබා දීමේදී සඳහන් කර ඇත්තේ රාජ්‍ය දැව සංස්ථාවේ චක්‍රලේඛ අංක 11/2012 (R-1) හා වෙළඳ බඩුවල තොග ඌනතා හෝ අතිරික්ත සහ සංස්ථා දේපළවල වෙනත් අලාභ ආදිය සම්බන්ධව ඉදිරිපත් කර තිබූ චක්‍රලේඛ අංක රා.දැ.සං./09/2013 (R-2) දරන ලේඛන සම්බන්ධයෙන් මෙම සේවකයින් දැනුවත් වී නොමැති බවය. මේ සම්බන්ධයෙන් සලකා බැලීමේදී දෙවන පාර්ශ්වය විසින් අදාළ ලිපි ලේඛන සිය ධූරාවලිය අනුව රාජ්‍ය දැව සංස්ථාවේ පටිපාටිය අනුව එහි සේවකයින්ට දැන ගැනීම වෙනුවෙන් යොමු කරන ක්‍රමවේදය අනුව බූස්ස දැව සංස්ථාවේ ප්‍රාදේශීය අංශයට අදාළ ප්‍රධානීන් වෙත යොමුකර ඇති බවත්, ඒ හරහා මෙම ලේඛන සම්බන්ධයෙන් එහි සේවකයින් දැන සිටිය යුතු බවත් තීරණය කරමි.

මෙම බේරුම්කරණයට අදාළව 2016/2017 වර්ෂවල තොග සමීක්ෂණයේ කලුවර කඳන් හැර හා කලුවර කඳන් සම්බන්ධයෙන් සිදු කළ ගණනය කිරිමේ ප්‍රකාරව මෙම සේවකයින් 09 දෙනාගෙන් මුදල් අයකර ගැනීම යුක්ති සහගත වන්නේ ද සම්බන්ධව දෙපාර්ශ්වයම කරුණු ඉදිරියත් කර ඇත.

පළමු පාර්ශ්වයේ ස්ථාවරය වී ඇත්තේ මෙම බූස්ස දැව ගබඩාව වෙත විවිධ ස්ථාන වලින් කැඩුණු හා දිරාපත් වූ දැව කඳන් ගෙනැවිත් දමා තිබූ බවත්, ඒ සම්බන්ධව මෙම ආරක්ෂක නිලධාරින් විසින් රාජකාරි කරන අවස්ථාවල එවන් දැව තොග පැමිණියහොත් තොරතුරු සටහන් කරන ලේඛනවල එම කරුණු ඇතුළත් කර ඇති බවත්, එසේ දැව කඳන් පැමිණීම සම්බන්ධව අවස්ථා කිහිපයකදීම ගබඩා භාර නිලධාරීවරයාද දැනුවත් කළ බවය. මෙවැන් කඳන් බූස්ස ගබඩාවට ගෙනවිත් දමා දීර්ඝ කාලයක් භාවිතා නොකිරීම නිසා මෙලෙස දිරාපත් වී ඇති බවත්, ඉහළ පාලන අධිකාරිය මේ සම්බන්ධව දිගින් දිගටම දැනුවත් කළ නමුත් කිසිදු ක්‍රියාමාර්ගයක් බූස්ස ගබඩා සංකීර්ණයේ එවැනි දිරාපත් වූ දැව සම්බන්ධයෙන් නොගත් බවත්, ආරක්ෂක නිලධාරීන් විසින් මෙම නුසුදුසු දැව සම්බන්ධයෙන් ගබඩාවට ගෙනවිත් දමන අවස්ථාවේ සටහන් තබා ඇති බව හා එම ලේඛන දැව සංස්ථාවේ බූස්ස දැව ගබඩාවේ නිලධාරීන් භාරයේ පවතින බවත්, එකී සටහන් එම ලේඛනවල අන්තර්ගත ව ඇති බවට පැමිණිල්ලේ සාක්ෂිකරුවන් දෙදෙනාම දෙවන පාර්ශ්වයේ හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් සාක්ෂි ලබා දී ඇත.

එකී කාරණය ඉල්ලුම්කාර පාර්ශ්වයේ 01 වන සාක්ෂිකරු වන පී. ඩබ්. විජේරත්න යන අය හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් පහත පරිදි දක්වා ඇත.

ප්‍ර : ඒ කියන්නේ දැව කඳන්වලට යම් කිසි දෙයක් සිදු වුණොත් අලාභ හානියක් සිදු වුනොත් ඒ තොරතුරු සටහන් ලේඛනයේ ඒක සටහන් කරනවා ද ?
පි : ඔව්
ප්‍ර : ඒ කියන්නේ දිරාපත් වෙච්ච දැව කඳන් තිබ්බොත් ඒකේ සටහන් වෙන්න ඕනෙ ?
පි : ඔව්. මෑත කාලීනව ඔය කිලිනොච්චිය පැත්තෙන් කඳන් ආවේ. කඳන් බාන කොටම කඳන් දෙකට කැඩිලා. ඊට පස්සේ අපි කතාබස් කරලා මේක පඩියෙන් කැපෙන නිසා අපි කිව්වා මේක හරියන්නේ නැහැ අංශ ප්‍රධානීන් දැනුවත් කළා. මේ කඳන් කැඩිලා කියලා අපි. අයි. පී. එකෙත් දාලා ඇති මේ කඳන් කැඩිලා කියලා මෙම ලොරියෙන් ආපු කඳන් බාද්දී කැඩුනා කියලා.
ප්‍ර : දැන් සාක්ෂිකරු කාටද දැනුවත් කළා කියලා කිව්වේ.
පි : ගබඩා නිලධාරීයාට ස්ටොක් භාර ගන්න එක්කෙනෙක් ඉන්නවානේ.
ප්‍ර : ඒ කියන්නේ වාචිකව ගබඩා නිලධාරියා දැනුවත් කරනවා ලිඛිතව ගබඩා සටහන් පොතේ සටහන් කරනවා ?
පි : ඔව්

(2023.03.08 දිනැති සාක්ෂි සටහන්වල 10 හා 11 පිටු)

ඉහත දැක්වූ පරිදිම ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් කැඳවූ දෙවන සාක්ෂිකරු වන ටයිටස් ප්‍රේමනාත් යන අයද එකී කාරණය සම්බන්ධයෙන් පහත පරිදි සාක්ෂි ලබා දී ඇත.

ප්‍ර : ඒ කියන්ගේ බූස්ස ගබඩාවට දිරාපත් වෙච්ච දැව කඳන් රැගෙන ආවොත් තොරතුරු සටහන් පොතේ ඒ සම්බන්ධයෙන් සටහනක් තැබිය යුතුයි නේද?
පි : ඔව්.
ප්‍ර : තමුන් කවදා හෝ එහෙම සිද්ධියක් සම්බන්ධයෙන් සටහනක් තබලා තියෙනවාද තොරතුරු සටහන් ලේඛනයේ ?
පි : තොරතුරු සටහන් පොතේ මම එහෙම සටහන් කරලා ඇති, මට දින වකවානු හරියට මතක නැහැ. පිංතූරත් තිබෙනවා මම ඉදිරිපත් කරලා තිබෙනවා

(2023.05.02 දින සාක්ෂි සටහන්වල 7, 8 පිටු)

ඉල්ලුම්කාර පාර්ශ්වයේ සාක්ෂිකරුවන් දෙදෙනාම සාක්ෂි දෙමින් සඳහන් කර ඇත්තේ අදාළ දිරාපත් දැව පිළිබඳ සටහන් යෙදූ තොරතුරු සටහන් ලේඛන ඇත්තේ බූස්ස ගබඩාවේ ඒ.ඕ. නිලධාරියා භාරයේ බවත්, ඒ අනුව පෙනී යන්නේ මෙම කරුණු තහවුරු කළ හැකි ලේඛන ඇත්තේ වගඋත්තරකාර ආයතනයේ භාරයේ වන බවය.

තවදුරටත් ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදෙමින් සඳහන් කර ඇත්තේ බූස්ස ගඩඩාවට දැව කඳන් ගෙන ඒම හා පිටවීම සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරින් සටහන් යොදන බවත්, දැවකඳන් ගෙනඑන හා / හෝ බාන අවස්ථාවලදී කැඩුණු හෝ දිරාපත් වී ඇත්නම් එකී කඳන් සම්බන්ධයෙන් සටහන් කරන බව පමණි. කෙසේ නමුත් යම් දැව කඳක් බූස්ස ගබඩාවට ගෙනවිත් දැමූ පසු එකී කඳන් අලෙවි කිරීමට අදාළව ආරක්ෂක නිලධාරින්ගේ සම්බන්ධයක් නොමැති බවත්, එකී කඳන් අලෙවි කිරීම වෙනත් අංශයක් විසින් සිදු කරන බවත්, කෙසේ නමුත් ඇතැම් අවස්ථාවල දැව කඳන් අලෙවි නොවී දිරාපත් වන තුරුම දීර්ඝ කාලයක් බූස්ස ගබඩාවේ තිබෙන බවද ඉල්ලුම්කාර පාර්ශ්වයේ සාක්ෂිකරුවන් සාක්ෂි ලබා දී ඇත.

එසේම ඉල්ලුම්කාර පාර්ශ්වය විසින්A-9 ලෙස ලකුණු කළ ලේඛනයක් ඉදිරිපත් කරමින් මෙම 2016/2017 කාලයට අදාළව ගබඩා නිලධාරි විසින් මෙම කාරයේ නිසි පරිදි තොග ගණනය සිදුකර නොමැති බවට හා තමාට අසාධාරණයක් සිදු වී ඇති බවට දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා වෙත යැවූ ලිපියක්ද ඉදිරිපත් කර ඇත. තවද තොග ගණනය කිරීම් පිළිබඳව කමිටුවක් මගින් වෙනස්කම් කිරීම සඳහා යෝජනා කළ සංශෝධන අන්තර්ගතව ඇති A-10 ලෙස ලකුණු කළ ලිපියක් ද පරීක්ෂණයට ඉදිරිපත් කර ඇත.

මෙම පරීක්ෂණයේ ඉදිරිපත් කෙරුණු සාක්ෂි විශ්ලේෂණය කිරීමේදී දෙවන පාර්ශ්වය විසින් සාක්ෂිකරුවන් 04 දෙනෙකු කැඳවා ඇත. එකී සාක්ෂිකරුවන් මගින් වගඋත්තරකාර ආයතනය විසින් ස්ථාපනය කිරීමට උත්සහ කර ඇත්තේ වගඋත්තරකාර ආයතනයට අදාළ රෙගුලාසි හා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් හා ආරක්ෂක නියාමකයින් විසින් එකී රෙගුලාසි සම්බන්ධයෙන් දැන සිටිය යුතු බවට තත්ත්වයන් හා නිසි පරිදි විගණන අංශය මගින් ගණනය කිරීම් සිදුකර අදාළ අය කිරීම් ඉල්ලුම්කාර පක්ෂයේ ආරක්ෂණ නිලධාරින් 09 දෙනාගෙන් අය කර ඇති බවට වන කරුණු පමණි.

මෙම වගඋත්තරකාර ආයතනයේ සාක්ෂිකරුවන් විසින් ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් මතු කළ සිය ස්ථාවරයට එරෙහිව එම ඉල්ලුම්කරුවන් බූස්ස ගබඩාවේ අදාළ ලේඛනවල ආරක්ෂක නියාමකයින් ලෙස නිසි පරිදි සටහන් යොදා නොමැතිද, නැතිනම් බූස්ස ගබඩාවේ 2016/2017 වර්ෂයට අදාළව නිසි පරිදි තොග සමීක්ෂණය කිරීමේදී ආරක්ෂක නියාමකයින්ගේ වරද අනාවරණය වී, එම කාරණය මත අදාළ අයකර ගැනීම් ආරක්ෂක නිලධාරීන්ගෙන් අය කර ගැනීම සාධාරණීකරණය කරන ආකාරයෙන් සාක්ෂි මෙහෙය වීමක් සිදුකර නොමැති බව පෙනේ. දෙවන පාර්ශ්වයේ සාක්ෂි පහත පරිදි මා විසින් විශ්ලේෂණය කර සිටි.

මතු සඳහන් කළ පරිදි වෙනත් ගබඩාවල පැවති දිරූ හෝ භාවිත කිරීමට නුසුදුසු දැවකඳන් මෙම බූස්ස ගබඩාවට ගෙනවිත් දමා දීර්ඝ කාලයක් දිරාපත් වීමට හැර තබා 2016/2017 අදාළ වර්ෂයේ තොග සමීක්ෂණය සිදුකර ඇති නම් හා ඒ මත අනාවරණය වූ දිරාපත් වූ දැව කඳන් සම්බන්ධයෙන් බූස්ස දැව ගබඩාවේ ආරක්ෂක අංශයේ සේවකයින්ගෙන් වන්දි අයකර ගෙනඇත්තම් එය අසාධාරණ කාරණාවකි. මෙම දැව ගබඩාවේ 2016/2017 වර්ෂවලට අදාළව තොග සමීක්ෂණ කරන අවස්ථාවේ එවැනි දිරාපත් වූ හෝ භාවිත කළ නොහැකි දැවතොග වෙනත් ගබඩාවලින් මෙම බූස්ස ගබඩාව වෙත ගෙනවිත් ඇති බවට හා ඒ සම්බන්ධව ඉහළ නිලධාරීන් විටින් විට දැනුවත් කළ නමුත් වගඋත්තරකාර ආයතනය විසින් කිසිදු සාධනීය පියවරක් නොගත් බවට පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ තර්කය බිඳ දැමීමට වගඋත්තරකාර ආයතනය විසින් සිය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මගින් මෙම විමර්ශනයට කරුණු අනාවරණය කර නොමැත.

දෙවන පාර්ශ්වය විසින් කැඳවා තිබූ 04 වන සාක්ෂිකරු වන චමිල් නිශාන්ත යන අයගේ හරස් ප්‍රශ්න අසමින් පළමු පාර්ශ්වය විසින් එවකට තොග ගබඩා නිලධාරි ලක්මාලි විජේරත්න අය විසින් දැව සංස්ථාවේ සාමාන්‍යාධිකාරවරයා වෙත ලිපියක් (A-9) මගින් දැව ඌනතාවයට අසාධාරණ ලෙස ගබඩා නිලධාරීන්ගෙන් හා ආරක්ෂක නිලධාරීන්ගෙන් මුදල් අයකර ඇති බවත්, ඒ සම්බන්ධව සොයා බලන ලෙසත්, ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. වග උත්තරකාර ආයතනය විසින් එකී කරුණ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව කරුණු මෙම විමර්ශනයට ඉදිරිපත් කර නොමැත. එසේම (A-10) ලෙස ලකුණු කරමින් ලිපියක් ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් ලකුණු කරමින් පෙන්වා දී ඇත්තේ වගඋත්තරකාර ආයතනයේ 2016/2017 වර්ෂයේ තොග සමීක්ෂණයේ වටිනාකම් ගණනයේ අඩුපාඩු පවතින බවත්, එකී අඩුපාඩු අවම කිරීමට එම වාර්තාවෙන් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර ඇති බවය. නමුත් එකී A-10 වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කළ බවට හෝ ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ බවට දෙවන පාර්ශ්වය විසින් පිළිගත හැකි කරුණක් මෙම පරීක්ෂණය ඉදිරියේ ඉදිරිපත් කර නොමැත.

දෙවන පාර්ශ්වය විසින් සාක්ෂි ලබා දී ඇති 03 වන සාක්ෂිකරු විසින් සිය අවබෝධයෙන් තොරව වගඋත්තරකාර ආයතනයේ නීති නිලධාරි විසින් සකස් කළ දිවුරුම් ප්‍රකාශයක් අත්සන් කර ඇති බවත්, ඒ මගින් ඉදිරිපත් කළ R-1 හා R-2 දරන ලේඛන සම්බන්ධව ඔහුගේ දැනුම අනුව අදාළ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර නොමැති බවත්, වැඩිදුරටත් එම සාක්ෂිකරු සාක්ෂි ලබා දීමේදී තමා ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ කිසිදු කරුණක් පිළිබඳ සිය අවබෝධයෙන් සාක්ෂි ලබා දුන් බව පිළිගත නොහැකි බව මා හට නිරීක්ෂණය වූ අතර දෙවන පාර්ශ්වය 03 වන සාක්ෂිකරුගේ 2024.02.12 දින මෙහෙයවා ඇති සාක්ෂිය අනුව ඔහු ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශයේ කරුණු පිළිගත නොහැකි බවට මා තීරණය කරමි. එසේම එකී දිවරුම් ප්‍රකාශය සිය නීති නිලධාරිනිය සැකසූ පසු ඔහු විසින් අත්සන් කළ බවට සාක්ෂිකරු විසින් මෙම පරීක්ෂණයේ දී පිළිගෙන ඇත.

බේරුම්කාරතුමා ප්‍රශ්නකර සිටී.

ප්‍ර : ඔබ විසින් සකස් කරන ලද දිවුරුම් ප්‍රකාශය පිළියෙල කිරීමට උපදෙස් දුන්නේ කවුද?
උ : නීති නිලධාරිතුමිය
ප්‍ර : මෙම දිවුරුම් ප්‍රකාශය සකස් කර තිබෙන්නේ නීති නිලධාරිතුමිය?
උ : ඔව්
(2024.02.12 දින සාක්ෂි සටහන්වල 13, 14 පිටු)

වගඋත්තරකාර ආයතනය විසින් කැඳවා ඇති දෙවන සාක්ෂිකාරිය විසින් සාක්ෂි ලබා දී ඇත්තේ තම අංශයට ඉදිරිපත් වූ තොග සමීක්ෂණ වාර්තාව අනුව දැව සංස්ථාවේ විගණන අංශය විසින් නිසි පරිදි විගණන කටයුතු සිදුකර අදාළ ගණනය කිරීම් සිදුකර ඇති බව තහවුරු කිරීමටය. එම සාක්ෂිකාරිය පළමු පාර්ශ්වයේ හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් සඳහන් කර ඇත්තේ තොග සමීක්ෂණයේ දෝෂ පැවතියාද යන්න සම්බන්ධයෙන් ඇයට දැනුමක් නොමැති බවත්, විගණන අංශයට අදාළ අවසන් වාර්තාව ඉදිරිපත් වූ පසු ඒ මත නිවැරදිව ගණනය කිරීම් සිදුකර ඇති බවත්, අවස්ථා කිහිපයකදී එම ගණනය කිරීම් පෙර තොග සමීක්ෂණ වාර්තාවල සිදු වූ වෙනස්කම් මත සංශෝධනය වී ඇති බවය. දෙවන පාර්ශ්වයේ පළමු සාක්ෂිකරු මගින් ආරක්ෂක නියාමක නිලධාරීන් ආයතනයේ චක්‍රලේඛ සම්බන්ධව දැනුවත් වී සිටිය යුතු ආකාරය ස්ථාපනය කිරීමට කැඳවා ඇත.

මෙම පරීක්ෂණ සභාව ඉදිරියේ පැන නැගී ඇති මූලික ප්‍රශ්න කිහිපයක් සම්බන්ධයෙන් පළමු පාර්ශ්වයෙන් ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් ඉහත ආකාරයට ඉදිරිපත් කර ඇති සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුව පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් වී නොමැති බව මා සඳහන් කර සිටිමි. එනම්,

01. දිර්ඝ කාලයක් දැව කඳන් බුස්ස ගබඩාවේ දිරාපත් වී ඇද්ද, වෙනත් ගබඩාවල දිරාපත් වූ කඳන් බුස්ස ගබඩාවට ගෙනැවිත් දමා තිබේද, ඒ කාරණා සම්බන්ධව ඉහල නිලධාරීන් දැනුවත් කළ පසු සාධාරණ ක්‍රියාමාර්ගයක් එම පැමිණිලි සම්බන්ධව 2016/2017 කාලයට අදාළව දෙවන පාර්ශ්වය විසින් ගෙන තිබේද?

02. 2016/2017 තොග සමීක්ෂණයේදී නිසි ආකාරයෙන් තොග සමීක්ෂණයේ ඌණතා ගණනය කිරීම් සිදුකර එකී ගණනය කිරීම් මත ආරක්ෂක නියාමකයින්ගේ වැටුපෙන් අදාළ හිඟය අයකර ගැනීමට එම ආරක්ෂක නිලධාරීන් නිසි පරිදි වගකීමට සාධාරණ ලෙස බැඳෙන ආකාරයෙන් ආරක්ෂක නියාමකයින්ගෙන් මුදල් අයකර තිබේද?

03. බුස්ස ගබඩාවේ පැවති දැව කඳන් 2016/2017 වර්ෂයට අදාළව දැව සංස්ථාව විසින් නිසි පරිදි විමර්ශනයක් සිදුකර තොග ගණනය කිරීම් සිදුකර ආරක්ෂක නියාමකයින්ට අදාළව ඌනතා සඳහා වගකීම පැවරෙන ආකාරයෙන් කටයුතු කර තිබේද?

ඉහත සියලු කාරණා නිසි පරිදි දැව සංස්ථාව විසින් සැලකිල්ලට ගත් පසු R-11 හා R-12 පරිදි රු. 26,872.59 හා R-13 හා R-14 පරිදි රු. 43.52 ක් හා R-14 පරිදි රු. 72,453.10 ලෙස මුලු මුදල එක් ආරක්ෂක නියාමකයෙකුගෙන් රුග 99, 369.21 ක් පරිදි අයකර ගෙන තිබේන බවට දෙවන පාර්ශ්වය විසින් මෙම විමර්ශනයේදී සනාථ කර නොමැත.

ඒ අනුව මෙම විමර්ශනයේ දී දෙපාර්ශ්වයෙන් ඉදිරිපත් වූ සියලු සාක්ෂි හා ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු මා පළමු පාර්ශ්වයේ ආරක්ෂක නියාමකයෙකුගෙන් මුලු මුදල වශයෙන් රු. 99,369.21 මුදලක් අසාධාරණ ලෙස එම ඉල්ලුම්කරුවන්ගේ වැටුපෙන් අයකරගෙන ඇති බවට තීරණය කරමි. ඒ අනුව එකී ක්‍රියාව සම්බන්ධයෙන් පහත සහන පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කාර සාමාජිකයින් 09 දෙනා වෙත ලැබිය යුතු බවට තීරණය කරමි. එනම්.

01. R-11 හා R-12 පරිදි රු. 26.872.50 හා R-13 සහ R-14 පරිදි රු. 43.52 ක් හා R-14 පරිදි රු.72,453.10 ලෙස එක් ආරක්ෂක නියාමකයෙකුගෙන් මුලු මුදල වශයෙන් අයකරගෙන ඇති රු. 99,369.21 ක මුදල නැවත එක් එක් සාමාජිකයාට දෙවන පාර්ශ්වයේ ආයතනය විසින් ගෙවිය යුතු බව තීරණය කරමි.

02. යම් ඉල්ලුම්කරුවෙකු මේ වන විට විශ්‍රාම ගෙන ඇත්නම් ඔහුටද එකී මුලු මුදලම මාස 06 ක් තුළ ගෙවීමට දෙවන පාර්ශ්වයේ ආයතනයට නියම කරමි.

03.ඒ අනුව සේවකයන් නව දෙනාටම ලැබිය යුතු මුළු මුදල ලෙස රු. 894,322.89 (අට ලක්ෂ අනූ හතර දහස් තුන්සිය විසි දෙකයි ශත අසූ නවය) ක මුදල මෙම තීරණය *ගැසට්* ගත කළ දින සිට මාස 6 ක් ඇතුළත දෙවන පාර්ශ්වය විසින් ඒ ඒ පුද්ගලයාට ගෙවා ඒ බව නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කිරීමට නියම කරමි.

මෙම පරීක්ෂණයේ දී මා ඉදිරියේ මෙහෙය වූ සාක්ෂි විමසා බලා මෙම තීන්දුව ප්‍රකාශයට පත් කළ අතර මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

නීතිඥ ප්‍රවීන් ප්‍රේමතිලක,
බේරුම්කරු

2025 පෙබරවාරි මස 20 වැනි දින,

EOG 07-0292

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.